"හුදකලාවේ ආවර්ජන" සමගින් සිය දිවි මගේ අනූ දෙවෙනි විය සැමරූ

# ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදී ඇස් පියසේන



ඡායාරූ - රංජිත් විජයසේකර

**පසුගිය නොවැම්බර් මස අටවෙනි සෙනසුරාද සිඩ්නි නුවර දී පවත්වන්නට යෙදුණු ආදී ආනන්දීයන් ගේ සුහද හමුවේ දී අද අප අතර සිටින ජ්‍යෙෂ්ඨතම ආදී ආනන්දීයයා මෙන්ම, ජ්‍යෙෂ්ඨතම මාධ්‍යවේදියා ද වන සේනාධීර පිය-සේනයන් විසින් රචිත නවතම කෘතිය වන "හුදකලාවේ ආවර්ජන" ග්‍රන්ථය දෙරට වැඩීමේ චාම් උත්සවයක් පවත්වන්නට යෙදුණි. මේ ඒ ඇසුරෙන් කරන සටහනකි.**

**මේ උත්සවයේ දී රසික සූරියආරච්චි ඇස් පියසේන ලේඛකයා සභාවට හඳුන්වා දුන්නේ මේ අයුරිනි.**

සේනාධීර පියසේන, එසේ නැතිනම් අප කවුරුත් දන්නා පරිදි ඇස් පියසේන, උපත ලැබුවේ වසර 1922 නොවැම්බර් මස 14 වෙනිද මීට අවුරුදු අනූ දෙකකට කලින්. මුලින්ම අළුත්ගම විදුහලෙන් ඉගෙනුම ලැබූ ඔහු පසුව කොළඹ ආනන්ද විද්‍යාලයට ඇතුළත් වුනා. ඒ වසර 1933 දී. පාසල් අධ්‍යාපනයෙන් අනතුරුව සේනාධීර පිය-සේන වැඩිදුර අධ්‍යාපනය ලැබීම පිණිස 1939 ජුනි මාසයේ ඉන්දියාවේ කල්කටා විශ්ව විද්‍යාලයට ඇතුලත් වුනා.

ඉන්දියාවට යන්නට පෙර ඔහු හොරණ ගත කළ කාලයේ දී සමසමාජ දේශපාලනයේ අත්පොත කියවා තිබූ සේනාධීර පියසේන දෙවන ලෝක යුධ සමයේ ලංකාවට නිවාඩුවට පැමිණි වෙලාවේ දී, ඒ කියන්නේ 1940 දී, ලංකා කොමියුනිස්ට් පක්ෂය විසින් ඒ වන නැවත අරඹන්නට කටයුතු කරමින් තිබූ "ජනශක්තිය" පුවත් පතේ ප්‍රකාශක ලෙස තම මාධ්‍යවේදී ජිවිතය ආරම්භ කළා.

ඒ දිනවල පැවති නීතිය අනුව පුවත්පතක ප්‍රකාශකයා වීමට නම් වයස විසි එකක් සපුරා තිබිය යුතුයි. ඒවන විට වයස දහ අටක තරුණයකු වූ සේනාධීර පියසේන කර ඇත්තේ තම වයස  අවුරුදු වෙනස් කොට පුවත්පතේ ප්‍රකාශක ලෙස ලියාපදිංචි කිරීමයි.

එතැනින් ඇරඹුණු සේනාධීර පියසේන ගේ මාධ-යවේදී ජිවිතය, ලේක්හවුසිය, රේඩියෝ සිලෝන්, පාර්ලිමේන්තුව, ඉන්දියාවේ ආකාශවාහිනී ගුවන් විදුලිය, දවස නිවස, ටයිම්ස් ආයතනය පමණක් නොව රජගෙදර සහ තානාපති සේවය හරහා අද වන විට අවුරුදු හැත්තෑ හතරක් පුරා ඇදී ගොස් තිබෙනවා. අද අවුරුදු අනූ දෙකක තරුණයෙක් විදියටත්  එද මෙන්ම නොවෙනස් ජවයෙන් සහ දැඩි උනන්දුවෙන් යුතුව, තම විශිෂ්ඨ ස්මරණ ශක්තියද, නිරවුල් චින්තනය ද උපයෝගී කරගනිමින් ලංකාවේ ද, ඕස්ට්‍රේලියාවේ ද පුවත්පත් සඟරා සඳහා ලිපි සපයන, ගුවන් විදුලි සේවා සඳහා සම්මුඛ සාකච්ඡා ලබා දෙමින් තම අත්දැකීම් බෙදහද ගන්නා ඇස් පියසේනයන් අප වැනි අංකුර ලේඛකයින්ට විශාල ආදර්ශයක්, ඉමහත් ආශ්වාදයක්.

සේනාධීර පියසේන ජ්‍යෙෂ්ඨ මාධ්‍යවේදියා වසර නවයක් ඉගෙනුම ලැබූ ආනන්ද විද්‍යාලයට පසුගිය නොවැම්බර් හතරවෙනි ද වසර එකසිය විසි අටක් පිරුණා. ඔහු නොවැම්බර් මස දහතරවෙනිද තම අනූ දෙවෙනි උපන් දිනය සමරණවා. ඔහු අද ලොව වෙසෙන ජ්‍යෙෂ්ඨම ආදී ආනන්දීයයා පමණක් නොව අද ලොව වෙසෙන ජ්‍යෙෂ්ඨතම මාධ්‍යවේදියා බවට ද සැළකිය හැකි යැයි මට සිතෙනවා. ඔහු අද දවසේ අප අතර ජිවත්වීම අප සැමගේ ආඩම්බරයට කරුණක් සහ අපේ භාග්‍යයක් කොට මා සළකනවා.

**මෙහිදී කතා කළ ජ්‍යෙෂ්ඨතම මාධ්‍යවේදී සේනාධීර පියසේන මෙසේ පැවසීය.**

මේ අවස්ථාවේ ආදී ආනන්දීයන් වන ඔබ අමතා මෙලෙස කතා කරන්නට ලැබීම ඉතා සතුටක්. ඒ මේ පොත මා පිළිගන්වා ඇත්තේ ආනන්ද මාතාවට සහ ඔබ සැමට එනම්, ආදී ආනන්දීයන් ට, වර්තමාන ආනන්දීයයන් ට සහ අනාගත ආනන්දීයන් ට වීමයි.

මා එසේ කරන්නට හේතුව වූයේ මගේ මාධ්‍ය ජිවිතයටත්, මා සාර්ථකව කළ හැම දෙයකටමත් මුල වුයේ ආනන්ද විද්‍යාල භූමිය වීමයි. එතැනින් මා ලැබූ පන්නරය වීමයි.

ආනන්ද විද්‍යාලය කියන්නේ හුදෙක් පාසලක් නො-වෙයි. එය ලංකාවේ ජාතික පුනර්ජිවයේ සංකේතයක්. ලංකාවේ ජාතික හැඟීම් ඇති කිරීමට මුල් වුනේ, එතෙක් තිබුණු විදේශීය අධ්‍යාපන ක්‍රමය වෙනස් කර සිංහල භාෂාව, සංස්කෘතිය, ඒ සියල්ලම නැවත කරළියට ගෙනාවේ ආනන්ද විද්‍යාලයයි.

ආනන්ද විද්‍යාලය ආරම්භ කරන අවස්ථාවේ දී, ඒවන විට ඉංගිරිසි භාෂාවෙන් ඉගැන්වූ කිසිම පාසලක, අඩු වශයෙන් රජයේ පාසලක් වූ රාජකීය විද්‍යාලයේවත්, දෙවන භාෂාව විදියට සිංහල ඉගැන්වූයේ නෑ. ඔවුන් ඉගැන්වූයේ ලතින් භාෂාවයි. නමුත් ආනන්ද විද්‍යාලයේ දෙවන භාෂාව ලෙස සිංහල ඉගැන්වීමට පටන් ගැනීම නිසා රාජකීය විද්‍යාලය ඇතුලු බොහෝ පාසල්වලට එය අනුගමනය කිරීමට සිදුවුණා. ඇත්තටම අපි සිංහල පමණක් නොවේ පාලි භාෂාවත් ඉගෙන ගත්තා.

අද මේ ශාලවේ බිත්ති පුරා ආනන්දයට සම්බන්ධ ආදී ශිෂ්‍යයින් ගේ, ගුරුවරුන් ගේ සහ විදුහල්පතිවරුන් ගේ ඡායාරූප ප්‍රදර්ශනය කර තියෙනවා. ලංකාවේ ජලවිදුලිය නිපදවීමේ පුරෝගාමිකයා වුණු ජිනදාස විමලසුරේන්ද්‍ර නිර්මාණ ශිල්පියා ඉන් එක් අයෙක්. ඉන් පසුව සිටි අයගෙන් මාධ්‍යවේදී විරේන්ද්‍ර විට්ටච්චි, වත්මන් නවදිල්ලියේ මහ කොමසාරිස් මහාචාර්ය සුදර්ශන සෙනෙවිරත්න වගේ අය ජාත්‍යන්තර කීර්තියට පත්වුණා.

ජාතික තලයේ නායකත්වයට පත් වුණු ඩීබී ජයතිලක, ඔහු 1942 වෙන තුරු ජාතික නායකයා, ආනන්ද විද්‍යාලයේ හිටපු විදුහල්පතිවරයෙක්. අයි රිෂ් ජාතික විදුහල්පති ප්‍රිට්ස් කූන්ස් අයර්ලන්ත ජාතික සටනට තරුණ වියේ දී සහභාගී වුණු අයෙක්. අවුරුදු විසි ගණනක් විදුහල්පති වූ ශ්‍රේෂ්ඨයෙක් තමයි පී ද එස් කුලරත්න. ලෝක බෞද්ධ සංගමයේ නායකත්වයට පත්වුණු ගුණපාල මලලසේකර, එල් එච් මෙත්තානන්ද, නියෝජ්‍ය විදුහල්පතිවරුන් වූ පී. සුන්දරලිංගම්, ටී.බී. ජයා වැනි අය මගේ සිහියට එනවා.

ආනන්ද විද්‍යාලය, බහු සංස්කෘතික, බහු ආගමික පාසලක් කියාත් හඳුන්වන්න පුළුවන්. ගාල්ලේ මන්සූර්, බේරුවල ඉම්ටියාස් මාකර් වැනි අය සිංහල කථිකත්වය සඳහා රන් පදක්කම දිනුවා.

ලංකාවේ ජාතික සංගමය ඇරඹුනේ ආනන්ද විද්‍යාලයේ ඕල්කොට් ශාලාවේ දී යි. සූරියමල් ව්‍යාපාරය ඇරඹුනේත් ආනන්දයෙන්. ලංකාවේ වාමාංශික ව්‍යාපාරයේ විප්ලවීය හඬ ලංකාවේ නිදහස සඳහා රාජ්‍ය මන්ත්‍රන සභාවේදී 1930 දශකයේ දී නැගූ ඇන් ඇම් පෙරේරා, පිලිප් ගුණවර්ධන, ඇස්. ඒ. වික්‍රමසිංහ වගේ අය ආනන්දයෙන් බිහි වුණු අය.

ආනන්ද විද්‍යාලයෙන් අපේ කාලයේ සිදුකළ තවත් පෙරළියක් තමයි ගම්බද පාසල්වල වසර දෙක



ඇස් පියසේනයන් තම දූ දරුවන් සමග තම අනූ දෙවෙනි උපන් දිනය සැමරූ අවස්ථාව

තුනක් සිංහලෙන් ඉගෙනුම ලැබූ සිසුන්ව පාසලට ඇතුළත් කරගෙන විශේෂ කඩිනම් පාඨමාලාවකට උගන්වා වසර දෙකකට පසු සාමාන්‍ය ධාරාවේ ඉංගිරිසි භාෂාවෙන් ඉගෙන ගැනීමට යොමු කිරීම. මේ නිසා මා වැනි අයට භාෂා දෙකෙන් කටයුතු කිරීමට පහසු වුණා.

මේ ආකාරයට ආනන්ද විද්‍යාලය එද නිදහස ලැබීමට පෙර කාලයේ ලංකාවේ විශාල පෙරළියක් කල තැනක් ලෙස හඳුන්වා දිය හැකියි. නිදහසෙන් පසුද ඒ ආකාරයෙන් කටයුතු සිදුවුණා. ආනන්ද විද්‍යාලය අප සැමට භාග්‍යයක්.

මේ පොත විකිණීමෙන් ලැබෙන මුදල් මා කුඩා කාලයේ සිටම පරිහරණය කළ ආනන්ද විද්‍යාලයේ පුස්තකාලය සඳහා පිරි නැමෙනු ඇති."හුදකලාවේ ආවර්ජන" ග්‍රන්ථය නුගේගොඩ සරසවි ප්‍රකාශනයකි.


